# අවංක දර කපන්නා

එක් දිනක දර කපන්නෙක් ගහක් අසල දර කපන අතරතුරදී ඔහුගේ පොරව ගඟට වැටුණා.



ඒක ගන්න විධියක් ගැන හිත හිතා ඉඳිද්දී මිනිස් වෙස් ගත් දෙවි කෙනෙක් එතනට ආවා.



"මම නුඹගෙ පොරව අරන් දෙන්නම්"ඒ මිනිස් වෙස් ගත් දෙවියන් ඔහුට කියනවත් සමඟම එක්වරම නොපෙනී ගියා.



දෙවියන් දියයට නොපෙනී ගිහින් ටික වෙලාවකට පසුව රත්තරන් වලින් තනන ලද පොරවක්  අරගෙන උඩට ආවා.

"නුඹේ පොරවද මේ"දෙවියන් දර කපන්නගෙන් ඇහුවා.
"අනේ දෙවියනේ ඔය මගේ පොරව නෙමෙයි" දර කපන්නා

පිළිතුරු දෙනවත් සමගම දියේ නොපෙනී ගිය දෙවියන් රිදියෙන් තැනූ පොරවක් සමග උඩට ආවා.
එසේනම් මෙවැනි පොරවක්ද ඔබට තිබුනේ"දෙවියන් දර කප න්නගෙන් දෙවැනි වරටත් ඇසුවා.

"අනේ දෙවියනේ ඔය පොරවත් මගේ නෙමෙයි" දර කපන්නා පිළිතුරු දෙනවත් සමගම දියේ නොපෙනී

දෙවියන් යකඩයෙන් තැනූ පොරවක් සමග උඩට ආවා.









ඒ පොරව දුටු දරකපන්නා සතුටින් ඉපිලී කීවා
ඔය තියෙන්නේ මගේ නැති වූ පොරව තමයි "





දෙවියෝ දර කපන්නාගෙ අවංක බවගැන පැහැදී එම
පොරෝ තුනම දර කපන්නාට තෑගි කර
" ඔබ වැනි අවංක මිනිසුන් හැමවිටම දෙවියො ආරක්ෂා
කරනවා කියලා එකවිටම නොපෙනී ගියා.



